**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම** සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ 'අධ්‍යක්ෂ ජනරාල්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ය.

2. **ව්‍යුහගත පරීක්ෂණය -** ව්‍යුහගත පරීක්ෂණය පැවැත්වෙන දිනය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | **40** |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | **25** |
| අතිරේක වෘත්තීය පළපුරුද්ද | **30** |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | **05** |
| එකතුව | **100** |

3. **පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව -**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත)** පුරප්පාඩු 03 ක් පිරවීමට කටයුතු කරනු ඇත.

4. **පත්වීම ක්‍රියාත්මක වන දිනය :**
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

5. **සේවා කොන්දේසි -** රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද , 2014. 05. 09 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත **රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත)** බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත් ව තෝරාගනු ලබන අපේක්ෂකයකු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සංස්කාරක තනතුරට පත් කරනු ලැබේ.

6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

7. **මාසික දීමනාව : රුපියල් 25,000/- කි.**

8. **සුදුසුකම් : අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට ,**
   I. **අධ්‍යාපන සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ උපාධියක් ලබා තිබීම.

II. **වෘත්තීය සුදුසුකම්** : තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ප්‍රකාශන සංස්කරණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

III. **පළපුරුද්ද** : රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාළව ලිපි සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

IV. **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

V. **වෙනත්** :
I ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
II විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
III තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

9. වයස : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 55

10. **අයදුම් කිරීමේ ක්‍රමය :**

a) අයදුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර , අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ජායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

b) සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය ලියාපදිංචි තැපැලෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, නො. 163, කිරුළපන මාවත, කොළඹ 05 යන ලිපිනයට 2015.04.24 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. අයදුම්පත් බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව **රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සංස්කාරක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත වන බඳවා ගැනීම** යන්න සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

c) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් , එසේ නැත්තම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරිමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද

2015 .03.10 වැනි දින ,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.
අංක 163, කිරුළපන මාවත,කොළඹ 05.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**ආදර්ශ අයදුම් පත්‍රය**

( කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යි.)

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයේ සංස්කාරක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුරු සඳහා වන (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම**

1.0 මාධ්‍යය :

සිංහල - 1

දෙමළ - 2

ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු :

1. මුල'කුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : _______
   උදාහරණ : SILVA A. B.
2. සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :_______________
3. සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :_______________
4. පෞද්ගලික ලිපිනය(සිංහලෙන් / දෙමළෙන්) :_________________
5. ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න
   ස්ත්‍රී - 1
6. විවාහක / අවිවාහක බව : අවිවාහක - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න
   විවාහක - 2
7. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ -2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
   අදාළ අංකය කොටුව තුළ ලියන්න
8. ජාතික හැඳුනුම්පත් අංකය :
9. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස: අවු: මාස දින
11. දුරකථන අංකය (තිබේ නම්) :

3.0 අධ්‍යාපන සුදුසුකම්:

| විශ්ව විද්‍යාලයය | ලබා ඇති උපාධිය | උපාධිය වලංගු වන දිනය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.0 වෘත්තීය සුදුසුකම්:

| ආයතනය | ලබා ඇති ඩිප්ලෝමාව | ඩිප්ලෝමාව වලංගු වන දිනය | කාළය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5.0 පළපුරුද්ද :

6.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සදහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

____________________________

අයදුම්කරුගේ අත්සන

දිනය : _____

7.0 අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ........................................................... දින මා ඉදිරියේදි ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

..........................................................................

අත්සන සහතික කරන ලද

නිලධාරියාගේ අත්සන

නම:- ..........................................................

පදවි නාමය:- ....................................................

ලිපිනය:-.........................................................

දිනය:- ..........................................

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරයෙකු හෝ රු. 22,935/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)